www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හොන්දුරාස් කුමන්ත්‍රනයේ සිට වසරක්

**One year since the Honduran coup**

**2010 ජූනි 28**

මහජන ඡන්දයෙන් තේරීපත් වූ හොන්දුරාස් ජනාධිපති මැනුවෙල් සෙලායා බලයෙන් පහකල මිලිටරි කුමන්ත්‍රනයෙන් ප්‍රථම වසර අද දිනයට යෙදී ඇත. එයින් ආරම්භ වූයේ එරට කම්කරු පන්තියට එරෙහිව අද දක්වාම ගෙන යන මර්දනකාරී ප්‍රචන්ඩත්වයේ කාල පරිච්ඡේදයකි.

ඔබාමා පාලනාධිකාරිය ජනාධිපති පෝර්ෆිරියෝ ලොබො සෝසාගේ වත්මන් පාලනය ආරක්ෂා කරන අතර එම කලාපය හා ලෝකය සමග එහි සබඳතා යථා තත්වයට පත් කරනු වස් එක්සත් ජනපදය දරන වෑයම නියෝජනය කරන්නේ, කුමන්ත්‍රනය සඳහා වොෂිංටනයේ නිහඬ පිටුබලයේ කූටප්‍රාප්තියයි.

2009 ජූනි 28 වෙනි දින සන්නද්ධ හමුදා භට කන්ඩායම් තෙගුසිගල්පාවේ ජනාධිපති මැදුරට කඩා වැදී තුවක්කු අමෝරා සෙලායා එලියට ඇදගෙන ගොස් පිටුවහලට යැවීමට සූදානම් කොට තිබූ ගුවන් යානයකට නැංවූහ. මෙම මෙහෙයුම මගින් 20 වන ශතවර්ෂයෙන් වැඩිමනක් කාලයක් එක්සත් ජනපද පිටුබලය සහිත මිලිටරි ආඥාදායකත්වයන් විසින් රටකට පසු තව රටක් පාලනය කල කලාපයක් වන ලතින් ඇමෙරිකාව තුල, 21 වන සියවස තුල සිදුකල පලමු සාර්ථක කුමන්ත්‍රනය සනිටුහන් කලේය.

කුමන්ත්‍රනය සඳහා පිටතට පෙන්වූ අරමුන වූයේ, හිටපු මිලිටරි ආඥාදායකත්වය හා එක්සත් ජනපද තානාපති කාර්යාලය එක්ව 1982 දී ඇටවූ ප්‍රතිගාමී ගිවිසුමක් වන රටේ ව්‍යවස්ථාව යලි සැකසීමට, ව්‍යවස්ථාදායක සම්මේලනයක් කැඳවනු වස් ජනතා සහය දිනාගැනීම සඳහා සෙලායා විසින් සංවිධානය කල උපදේශක ජනමත විමසුමක් අහෝසි කිරීමයි.

කුමන්ත්‍රනය සාධාරනය කරමින් හොන්දුරාස් ප්‍රභූ තන්ත්‍රය තුල එහි ආධාරකරුවන් සෙලායාට චෝදනා කලේ ඔහු තෙවැනි ජනාධිපති ධූර කාලයක් වෙනුවෙන් ව්‍යවස්ථා-විරෝධී බලය පැහැර ගැනීමකට අර ඇන්ද බව පවසමිනි. එක්සත් ජනපදයේ මාධ්‍ය නින්දිත ලෙස පුනරුච්ඡාරනය කල මෙම චෝදනාව, සෙලායාගේ අනුප්‍රාප්තිකයා තෝරා ගැනීමේ ඡන්දයකට පෙරාතුව ව්‍යවස්ථාදායක සම්මේලනයක් කැඳවීමේ ඡන්දයක් සංවිධානය කල නොහැකිය යන තර්කය සැලකූ විට, අර්ථ විරහිතය.

හොන්දුරාස්හි පාලක "පවුල් 10" හා වොෂිංටනයේ ඔබාමා පාලන තන්ත්‍රය යන ද්විත්වයටම සෙලායා නෙරපා හැරීමට වෙනත් හේතු පැවතුනි.

ස්වදේශීය කතිපයාධිකාරය, ධනවත් ඉඩම් හිමියෙක් හා වංශාධිපතියෙක් වන සෙලායා ද්‍රෝහියෙකු ලෙස දැකීමට පටන් ගත්තේ, හොන්දුරාස්හි ලාභ ශ්‍රමය අධික ලෙස සූරාකෑමෙහි ලා අන්තර්ජාතික සංගත සමඟ ගොඩනගාගෙන තිබූ ඔවුන්ගේ සම්බන්ධය තුලින් රැස්කර ගත් වාසනාව සුලු වසයෙන් පවා අහෝසි කිරීමට තර්ජනය කල අවම වැටුප් ඉහල නැංවීම වැනි සුලු ප්‍රතිසංස්කරන ඔහු ක්‍රියාවට දැමීම නිසාය.

ලාභ තෙල් හා නය සහන සඳහා වෙනිසියුලානු ජනාධිපති හියුගෝ චාවේස් සමග සෙලායාගේ මිතුරුකම වොෂින්ටනය දැකගත්තේ දීර්ඝ කාලයක් තිස්සේ තමන්ගේ "පිලිකන්න" වසයෙන් සැලකූ කලාපය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආධිපත්‍යයට එල්ල වියහැකි අන්තරායක් වසයෙනි. සමස්ත ලතින් ඇමෙරිකාවේම විශාලතම මිලිටරි කඳවුර හොන්දුරාස්හි පිහිටා තිබීම හේතුවෙන් මෙය සලකනු ලැබුවේ සුවිශේෂී අනතුරු ඇඟවීමක් ලෙසය. පසුගිය වසරේ ඉක්වදෝරයේ, මැන්ටාහි එක්සත් ජනපද මිලිටරි කඳවුර ඉවත් කර ගැනීමට බලකරනු ලැබීමේ තත්වය තුල පෙන්ටගනයට, හොන්දුරාස්හි පැල්මිරෝලා මිලිටරි කඳවුරු පහසුකම් අහිමිවීම මූලෝපායාත්මකව දරාගත නොහැක.

සෙලායා යලි බලයට පත්වීම කෙරෙහි ඔබාමා නාමික වශයෙන් සිය සහය පල කල ද කුමන්ත්‍රනයේ නායකයන්ට එරෙහිව කුමන හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කුමන්ත්‍රනයට විරුද්ධ වූවන්ට එරෙහිව

දියත් කල සැහසිකම් හෙලා දැකීමට හෝ කිසිවක් නොකලේය. සත්‍යය වන්නේ, රටේ ආයෝජන සහ වෙලඳාමේ සිය පංගුව වෙනුවෙන් එක්සත් ජනපදය මත රැඳී සිටින හොන්දුරාස් පාලක පන්තියට, වොෂිංටනයේ කොල එලියකින් තොරව එවැනි පියවරක් ගත නොහැකිව තිබූ බවයි. එක්සත් ජනපදය විසින් පුහුනු කරන ලද, උපදේශකත්වය සැපයූ හා දැඩි ලෙස සන්නද්ධ කල හමුදාවක් පෙන්ටගනයේ අනුමැතියෙන් තොරව එවැන්නක් ක්‍රියාත්මක නොකරනු ඇත.

කුමන්ත්‍රනය දියත්කල දිනයේ සිට පැවතියාක් මෙන්ම පැල්මිරෝලාහි කඳවුර වසරකට පසුත් සුපුරුදු පරිදි ක්‍රියාත්මක වේ. එක්සත් ජනපද දක්ෂින අන දෙන මූලස්ථාන ප්‍රධානී ඩග්ලස් ෆ්‍රේසර් හොන්දුරාස් කුමන්ත්‍රනයෙන් පසුව ප්‍රථම වතාවට එහි සංචාරයක යෙදෙමින් සඳහන් කලේ, රටේ මිලිටරිය සමග "සහයෝගීව කටයුතු කිරීම සඳහා බොහෝ අවස්ථාවන්" පවතින බවයි. වොෂින්ටනයෙන් ලැබෙන මිලිටරි ආධාර යලි ගලා එමින් තිබේ.

මිලිටරි කැරැල්ල සංවිධානය කල මූල්‍ය කතිපයාධිකාරය ජනාධිපති ලොබෝගේ ආන්ඩුවේ ප්‍රධානත්වය දරමින් තවමත් ශක්තිමත්ව සිටිති. අමු අමුවේම යුද නීතිය බලපැවැත් වූ කොන්දේසි යටතේ හා සමස්ත ඡන්ද දායකයන්ගෙන් අඩකට වඩා ඡන්දය ප්‍රතික්ෂේප කල පසුගිය නොවැම්බරයේ පැවත්වූ මැතිවරනයේ ජයග්‍රහකයා බවට ඔහු නම් කරන ලදි.

කුමන්ත්‍රනය සංවිධානය කල හා ඉන් අනතුරුව ලේවැකි මර්දනය දියත් කල අය කිසිදු දඬුවමක් නොලබා යහතින් වැජඹෙති. කුමන්ත්‍රන තන්ත්‍රයේ දේශපාලන නායක රොබට් මැකිලෙට්ටිගේ පාර්ලිමේන්තු වරප්‍රසාද කිසි දිනෙක අහිමි නොකිරීම සහතික කරනු වස් "යාවජීව කොන්ග්‍රස් සභිකයෙක්" ලෙස නම් කර තිබේ.. හොන්දුරාස් දුරකථන සමාගම වන හොන්දුටෙල්හි ප්‍රධානියා ලෙස පත්කර ඇත්තේ කුමන්ත්‍රනයේ මිලිටරි නායක ජෙනරාල් රෝමියෝ වැස්කුවෙස් ය.

දීර්ඝ හා අඳුරු ඉතිහාසයක් ඇති හොන්දුරාස්හි ඝාතක කල්ලි විශේෂිත ම්ලේච්ඡ ආකාරයකින් මර්දනය අඛන්ඩව පවත්වා ගෙන යති. ලෝබෝ බලයට පත් වූ තැන් සිට, හොන්දුරාස් ලෝකයේ මාධ්‍යවේදී වෘත්තිය වඩාත්ම අවදානම් රට බවට පත් කරමින් මාධ්‍යවේදීන් නව දෙනෙකු මරා දමා ඇත.

එමෙන්ම, 2009 ජූනි කුමන්ත්‍රනයට විරුද්ධ වීම නිසාවෙන් වෘත්තීය සමිති නායකයින් සහ තවත් අය දේශපාලන ඝාතනයට ඉලක්ක කර ඇත. එවැනි ඝාතන 14ක් ලෝබෝ බලයට පත් වූ තැන් පටන් සිදුව ඇති බව මානව හිමිකම් සංවිධාන තහවුරු කර තිබේ.

මෙම මිනීමැරුම් සඳහා හෝ කුමන්ත්‍රන මෙහෙයුමේදී සිදුකල ඝාතන පිලිබඳව හෝ මෙතෙක් කවරෙකු වත් අත් අඩංගුවට ගෙන නැත. සිතුමතේ අත්අඩංගුවට ගැනීම, පහරදීම, වධබන්ධන පැනවීම සහ විපක්ෂ මාධ්‍ය තහනම් කිරීම ඇතුලු මර්දනයේ අනෙකුත් රූපාකාරයන් අඩුවකින් තොරව අනවරතව සිදු වෙමින් පවතී.

පෙබරාවාරියේදී සිය බංකොලොත් භාවය නිවේදනය කරමින් ලෝබෝගේ ආන්ඩුව, ප්‍රතිගාමී බදු සහ ආන්ඩුවේ වියදම්වලින් සියයට 20ක පලල් කප්පාදු ද ඇතුලත්ව දරුනු කප්පාදු පියවර මාලාවක් පැනවුවේය. ආරක්ෂක හමුදාවන්ගේ අරමුදල් ඉහල දැමූ අතර ඒ මත මෙම බදු නොපැනවුනි. මෙම ක්‍රියාමාර්ගවල ඉලක්කය වූයේ ගෝලීය ප්‍රාග්ධනය විසින් ඇති කරන අර්බුදයට සහ පසුගිය වසරේ කුමන්ත්‍රනයට විරුද්ධවූවන්ට එරෙහි මර්දනයේ වියදම පීඩිත හොන්දුරාස් මහජනයාගේ වියදමින් පියවා ගැනීමයි.

සිදුව ඇත්තේ, දැනටමත් අර්ධගෝලයේ දුප්පත්ම කොටස් අතරේ සිටින හොන්දුරාස් වැඩකරන ජනතාවගේ ජීවන කොන්දේසි වඩාත් නරක අතට හැරීම පමනි. හොන්දුරාස් ජාතික සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව, තරුන කම්කරුවන් විශාල වසයෙන් ශ්‍රම වෙලඳපොලෙන් ඉවත් කිරීමත් සමග ම වැඩකරන වයසේ ජනගහනයෙන් සියයට 51ක් මුලුමනින්ම රැකියා විරහිතයන්ය.

ආන්තික දරිද්‍රතා රේඛාවේ මට්ටමට පහලින් දිවිගැටගසා ගැනීමට ජීවන සටනේ යෙදෙන සියයට 36 ඉක්ම වූ ජනයාද ඇතුලත්ව ජනගහනයෙන් සියයට 60ක් දුප්පත්කමෙන් පෙලෙති. හාම්පුතුන් සහ ආන්ඩුව වැටුප් කැපීම, වැඩ වේගවත් කිරීම හා කම්කරු නීති මුලුමනින්ම නොතකා හැරීම සඳහා පීඩනය යොදමින්, කම්කරු පන්තියට එරෙහිව මුගුරක් ලෙස විරැකියාව යොදා ගනිති.

වසරක් ඉකුත් වෙන තැන හොන්දුරාස් කුමන්ත්‍රනයේ ප්‍රමුඛ දේශපාලන පාඩම් පැහැදිලිවම ඉස්මත්තට පැමින තිබේ.

ඉන් පලමුවැන්න, බැරක් ඔබාමා බලයට පැමිනීම ජාත්‍යන්තරව සහ විශේෂයෙන් ලතින් ඇමෙරිකාව තුල සාමාකාමී සහයෝගීත්වය සහ "අන්‍යෝන්‍ය ගරුත්වය" කරා එක්සත් ජනපද විදෙස් පිලිවෙතෙහි මාරුවීමක් සලකුනු කලේය යන කියාපෑම්වල බංකොලොත්භාවය යි. කොලොම්බියාවේ මිලිටරි වැයික්කි රැක ගැනීමේ උත්සාහයන්ගෙන් පසුව පැමිනි හොන්දුරාස් සිද්ධීන්, හයිටියේ මිලිටරි මැදිහත්වීම හා මෙක්සිකෝවේ මත්ද්‍රව්‍ය යුද්ධය සඳහා එක්සත් ජනපද සහය වැඩි කිරීම පෙන්නුම් කරන්නේ, බටහිර අර්ධගෝලයේ වොෂිංටන් ආධිපත්‍ය යලි තහවුරු කරගැනීමට ප්‍රතිවිප්ලවවාදී ප්‍රචන්ඩත්වය හා මිලිටරි බලපෑම යොදා ගැනීමට ඔබාමා පාලානාධිකාරයේ ඇති සූදානමයි.

ඇමෙරිකන් ධනවාදයේ දිග්ගැස්සුන ආර්ථික පරිහානියේ මුවවිටදී එය මෙවැනි විධික්‍රම යොදාගැනීම පෙන්නුම් කරන්නේ, ලතින් ඇමෙරිකානු කම්කරු පන්තියේ විරෝධය මෙන්ම යුරෝපය හා චීනය ඇතුලු බලගතු ප්‍රතිමල්ලවයන් කලාපය තුලට වේගයෙන් විනිවිදීම මඟින් එල්ල වන වැඩෙන අභියෝග ජයගැනීමට දරන උත්සාහයකි.

දෙවන පාඩම වන්නේ, නෙරපන ලද හොන්දුරාස් ජනාධිපතිගේ ප්‍රතිචාර මගින් නිදසුන් කෙරෙන ධනපති ජාතිකවාදයේ බංකොලොත් කමයි. සෙලායා වොෂිංටනය සමග ගනුදෙනුවකින් සහන සලසාගනු වස් යෙදී සිටින තමාගේම නින්දිත වෑයම වෙනුවෙන්, කුමන්ත්‍රනයට විරෝධය පෑම අත්හැර දැමීමටත් ඔහු බලයෙන් පහකල කුමන්ත්‍රනකරුවන් සමග එක්සත් ජනපදයේ පිටුබලය ලබන ගිවිසුමක් හරහා යලි බලයට පැමිනීම තහවුරු කරගැනීමටත් නොනවත්වා වැඩ කර තිබේ.

හොන්දුරාස් සිදුවීම් යලිවතාවක් තහවුරු කර ඇත්තේ අධිරාජ්‍යවාදී මැදිහත්වීමකට, කුමන්ත්‍රන සහ ආඥාදායකත්වයන්ට කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන බලමුලුගැන්වීමකින් පිටත සාර්ථක ලෙස විරුද්ධත්වය පෑ නොහැකි බවයි. පසුගිය වසරේ ස්ථාපිත කරන ලද කුමන්ත්‍රන තන්ත්‍රයට ආරම්භයේ පටන් හොන්දුරාස් කම්කරුවන් දිරිමත්ව විරෝධය පා ඇති මුත් ඔවුන්ගේ අරගලය සෙලායා සහ මැකිලෙට්ටි යන දෙදෙනාගේම පක්ෂය වන ධනේශ්වර ලිබරල් පක්ෂයට ගැටගැසුන නායකත්වයක් විසින් අවමංගත කොට පීලිපන්නවා ඇත.

හොන්දුරාස් හා සමස්ත ලතින් ඇමෙරිකාව වෙලාගනිමින් තිබෙන වත්මන් අර්බුදය හමුවේ දැවෙන අවශ්‍යතාව වන්නේ, සියලුම ධනපති පක්ෂවලින් ස්වාධීන හා, එක්සත් සමාජවාදී ඇමරිකානු සමූහාන්ඩුවක් සඳහා අරගලයක කොටසක් වසයෙන්, හොන්දුරාස් පමනක් නොව සමස්ත කලාපයම සමාජවාදී ලෙස පරිවර්තනය කිරීම සඳහා වන වැඩපිලිවෙලකින් සන්නද්ධ කම්කරු පන්තියේ නව විප්ලවවාදී ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැංවීමයි.

බිල් වෑන් ඕකන්

© www.wsws.org